# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013**
**(නව නිර්දේශය)**
**2016 අගෝස්තු - ඔක්තෝබර්**

**මානවශාස්ත්‍ර පීඨය**

**නාට්‍ය හා රංග කලාව - DMAT - E 3015**

**නූතන යුරෝපීය හා ඇමරිකානු නාට්‍ය කලාව**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. කාර්මික විප්ලවයෙන් පසු ඇති වූ ආර්ථික හා දේශපාලන විපර්යාසයන් නාට්‍ය කලාවට බලපෑ ආකාරය හා එහි ප්‍රතිඵල පිළිබඳ විග්‍රහයක් කරන්න.

02. දෙවන ලෝක යුද්ධයෙන් පසු යුරෝපීය සමාජයේ ඇතිවූ මානසික කම්පනය නාට්‍ය කලාවේ වෙනස්වීම් කෙරෙහි බලපෑ ආකාරය නිදසුන් සහිතව විමසන්න.

03. ඇමරිකානු නාට්‍ය කලාවේ ඓතිහාසික විකාශය පිළිබඳ විමසීමක් කරන්න.

04. "අරගලය පවතින්නේ ඔවුනොවුන් අතර නොව ඔවුන් ගතකරන තේරුමක් නැති ජීවිතය සමඟ ය." **වෙරිවත්ත** නාට්‍යයේ චරිත හා කතා වින්‍යාසය ඇසුරින් විමසන්න.

05. "නෝරා තමාගේ ශක්තිය විදහා පා ඇති අතර ටෝවල්ඩ් මෙන්ම නෝරා ද නැවත සමාජය හැදෑරිය යුතු බවත් තව බොහොමයක් දේ ඉගෙනගත යුතු බවත් ඉබ්සන් ගේ අදහස වේ." **බෝනික්කි ගෙදර** නාට්‍ය ඇසුරින් විමසන්න.

06. එපික් රංගය හා යථාර්ථවාදී රංගය අතර පවතින වෙස්කම් කවරේදැයි **හුණුවටයේ කථාව** සහ වෙරිවත්ත නිදසුන් කොට විමසන්න.

07. අසම්මත හෙවත් න්‍යායරෝධී නාට්‍ය පවතින සම්ප්‍රදායට හා සම්මතයට එරෙහි වේ. ගොඩෝ **උන්නැහේ එනකං** ඇසුරින් විමසන්න.

08. මිනීමරුවන් දෙදෙනෙකුගේ ආත්ම ප්‍රකාශනය ඉක්මවා ගිය ධනවාදී සමාජ ක්‍රමය ඇතුලාන්තයේ බිඳවැටීම **කොන්තරාත්තුව** නාට්‍යයේ චරිත මඟින් විවරණය කරයි. විමසන්න.

09. නූතන ඇමරිකානු සිහිනය හඹා යන තාරුණ්‍යයේ ඛේදවාචකය **"පුංචි පළිඟු රූප"** නාට්‍යයේ මුඛ්‍ය තේමාව වේ. විමසන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

1. ස්ටැනිස්ලව්ස්කිගේ න්‍යායාත්මක රූපනය (Method Acting)
2. මේයර්ගෝල්ඩ්
3. කුරිරු රංගනය (Theatre of Cruelty)
4. දිළිඳු රංගනය (Poor theatre)

*******************